**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:32/2025**

මගේ අංකය:**NP/07/10/01/207**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2025.09.22

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව
උතුරු පළාත

**උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සම්භාහක (Masseur) III වන ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීමේ සඳහා අයදුම්පත් කැඳවීම - 2025**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/014/01/Recruitment/2025 දරණ 2025.08.04 දිනැති නිර්දේශිත ලිපියට අනුව, **උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින සම්භාහක (Masseur) තනතුරේ III ශ්‍රේණියේ** පුරප්පාඩු **06 (පිරිමි - 03, කාන්තා - 03)** ක් සඳහා බඳවා ගැනීමේ සීමිත (Limited) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පත්වීම් බලධාරියා විසින් **2025 නොවැම්බර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.10.08** වේ.

මෙම තනතුර සඳහා උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන ප්‍රාථමික මට්ටමේ ස්ථිර සේවකයන් හට අයදුම් කළ හැක.

## 01. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

01.1 **2013.01.01** වැනි දින සිට ක්‍රියාත්මක වන **උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින සම්භාහක (Masseur)** තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුර හා සම්බන්ධ කලින් කලට නිකුත් කරනු ලබන නියමයන්, විධිවිධාන යනාදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් **පවතින සම්භාහක (Masseur) තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

01.2 මෙම තෝරාගැනීම සඳහා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් **සම්භාහක (Masseur) තනතුරේ III ශ්‍රේණියට** පත්කරනු ලැබේ.

01.3. මෙම තනතුර වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර, ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි **සම්භාහක (Masseur) තනතුරේ III ශ්‍රේණියට** බඳවා ගත් දින සිට **වසර 03 ක්** ඇතුළත **පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන්** සමත් විය යුතුය.

01.4. මෙම තනතුර සඳහා පිරිමි අයදුම්කරුවන් තුන්දෙනෙකු **(03)**, කාන්තා අයදුම්කරුවන් තුන්දෙනකු **(03)** වශයෙන් අයදුම්කරුවන්/අයදුම්කාරියන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ.

01.5. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

01.6. එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අයදුම්කරුවෙකු, එකී සේවා ස්ථානයේම "අවම වශයෙන් **වසර 05 ක්** අඛණ්ඩව සේවය කළ යුතුය" යන්න අනිවාර්ය කොන්දේසියකි.

01.7. පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 02. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 1-2025** වැටුප් කේතය අනුව **සම්භාහක (Masseur) III ශ්‍රේණියේ** තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.45,230 - 10 X 540/= - 11 X 630= - 10 X 890/= - 10 X 1,190/= - 78,360/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 03. සුදුසුකම්

**<u>(අ) සාමාන්‍ය සුදුසුකම්</u>**

1. උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින කාර්යාලවල සහ රෝහල්වල සේවය කරන ප්‍රාථමික මට්ටමේ කුමන හෝ තනතුරක සේවයේ ස්ථිර කරන ලද, අවම වශයෙන් වසර පහක (05) **අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක්** සම්පූර්ණ කර තිබිය යුතුය.

2. අයදුම්පත්භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර පහක (05) කාලය තුළ දී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

**<u>(ආ) අධ්‍යාපන සුදුසුකම්</u>**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **එක් වරකදී** මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ ගණිතය යන විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව තවත් වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

**<u>(ඇ) වෘත්තීය සුදුසුකම්</u>**

ජාතික වෘත්තීය කුසලතා මට්ටම - 2 හෝ 3 ට නොඅඩු (NVQ - 2 or NVQ - 3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමන ජාතික වෘත්තීය කුසලතා සහතිකය, තනතුරට අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳව ලබා තිබිය යුතුය.

නැතහොත්

දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ලියාපදිංචි ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳව මාස 03 ක සහතිකපත් පාඨමාලාවක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**(ඈ) ශාරීරික යෝග්‍යතාවය**

1. අයදුම්කරු මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතු අතර, අයදුම්කරුගේ උස අවම වශයෙන් අඩි පහයි (05) අඟල් තුනට (03) නොඅඩු විය යුතුය.
2. සෑම අයදුම්කරුවෙකුම උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික, මානසික යෝග්‍යතාවයකින් යුතු විය යුතුය.

**(ඉ) පළපුරුද්ද**

උතුරු පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින කාර්යාලවල සහ රෝහල්වල සේවය කරන ප්‍රාථමික මට්ටමේ කුමන හෝ තනතුරක සේවයේ ස්ථිර කරන ලද, අවම වශයෙන් වසර පහක (05) **අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක්** සම්පූර්ණ කර තිබිය යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.**

## 04. බඳවා ගැනීමේ පරිපාටිය

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකින් මගින් පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් සහ කුසලතා පදනම මත බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, සේවා ව්‍යවස්ථාව, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව **සම්භාහක (Masseur) III ශ්‍රේණියේ** තනතුර සඳහා බඳවාගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා ඇති සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. බඳවා ගැනීමේ දී හෝ බඳවා ගැනීමෙන් පසු අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

## 05. විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත** යන නමට **යාපනය තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 06. අයදුම්කිරීමේ පිළිවෙල

06.1 මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත සම්පූර්ණ කර, **2025.10.08** හෝ **ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

06.2 ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/207"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06.3 අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ නොකරන ලද අයදුම්පත් පිළිගනු නොලැබේ.

06.4 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් හට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපි පත්වීම් බලධාරියා විසින් යවනු ලැබේ.

06.5 නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරාගත යුතුය.

06.6 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවත් එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් පිළිබඳව අදාළ අයදුම්කරුවන් වෙත දන්වා යවනු ලැබේ.

## 07. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන විට හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලබන අතර, අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 08. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

අයදුම්කරුවන් ස්වකීය අනන්‍යතාව ඔප්පුකිරීම සඳහා හත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය (Passport)
(iii) වලංගු රියදුරු බලපත්‍රය (Driving License )

## 09. අත්සන සහතික කිරීම

**සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ.** අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීම සඳහා බලයලත් නිලධාරියෙකු ලවා තම අත්සන සහතික කරවා ගත යුතුය.

## 10. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. **(මුළු ලකුණු 100 )**

| අනු අංකය | ලකුණු ලබාදෙන විෂයය අන්තර්ගතය | උපරිම ලකුණු |
|---|---|---|
| **01.** අමතර අධ්‍යාපන සුදුසුකම් | | |
| | <u>අ.පො.ස (සා/පෙ) විභාගයේ ප්‍රතිඵල සඳහා ලකුණු</u><br><u>පැරණි විෂය නිර්දේශය</u>: D - 04, C - 02<br><u>නව විෂය නිර්දේශය</u>: A - 03, B - 02, C - 01 | ලකුණු 25 |
| 02 | <u>**අමතර පළපුරුද්ද**</u><br>සෑම වසරක් සඳහාම ලකුණු 06 බැගින් ලබාදිය හැකි අතර, මාස 06 කට වඩා වැඩි මාස 12 කට වඩා අඩු සක්‍රීය සේවා කාලයක් සඳහා ලකුණු 03 ක් ලබාදෙනු ලැබේ. | ලකුණු 60 |
| 03 | <u>**අමතර සුදුසුකම්**</u><br>තනතුරට අදාළ සහ සුදුසු අමතර සුදුසුකම් | ලකුණු 10 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතා | ලකුණු 05 |
| **මුළු ලකුණු** | | **100** |

**11.** මෙම නිවේදනයේ සඳහන් කර ඇති හෝ සඳහන් කර නොමැති කරුණු සම්බන්ධයෙන් හෝ සැළකිල්ලට ගන්නා ලද හෝ සැළකිල්ලට නොගන්නා ලද කරුණු සම්බන්ධයෙන් කිසියම් අපැහැදිළි බවත් සම්බන්ධයෙන් හෝ වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

<u>සැළකිය යුතුය</u>

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iii. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

iv. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

ආල්වාප්පිල්ලෙ සිරි
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.09.22**

**පිටපත්:-**

1. ප්‍රධාන ලේකම්, උතුරු පළාත - කා.දැ.පි
2. ආණ්ඩුකාර ලේකම්, උතුරු පළාත - කා.දැ.පි